# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය


ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.
දුරකථන / ෆැක්ස් : 2556629 වෙබ් අඩවිය : www.slpia.lk ඊ-මේල් : slpia@sltnet.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/මැ.ආ/169/20 ඔබේ අංකය :

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2020.09.09

**2020.08.28 වන දින පැවති කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ රැස්වීම පැවැත්වීම සම්බන්ධව.**

ඔබතුමාගේ පූර්ව අනුමැතිය පරිදි, ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය වෙන අභිනවයෙන් පත්කරගන්නා ලද කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ ප්‍රථම රැස්වීම 2020.08.28 වන දින පැය 10.00 ට කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්‍යාලයීය ශ්‍රවණාගාරයේදී ඉතාමත් සාර්ථක අයුරින් පවත්වන ලදි.

එදින සහභාගිවන ලද කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් විසින් පහත සඳහන් යෝජනා, අදහස් හා ගැටළු ඉදිරිපත් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා වෙත දැනුම් දෙන මෙන් ඉල්ලීම් කරන ලදි.

01. පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ නිල ඇඳුම් කොටස් හා ආයිත්තමවල දැඩි හිඟයක් පවතින බවත්, මෑතකදී උසස්වීම් ලද නිලධරයන්ටද නිල ඇඳුම් කොටස් නොමැතිව අර්බුදයක සිටින බැවින්, එම ගැටළුව විසඳීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසද.

02. සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම් ලද නිලධරයන් වැඩ බලන කාලය තුළ හරස් බඳ පටිය පැළඳීමට අතීතයේ අවකාශය තිබුනේ නැත. නමුත් වර්තමානය වන විට සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්වූ වහාම හරස් බඳ පටිය පළඳින බව නිරීක්ෂණය වන අතර, එම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ නිලධරයන් හඳුනා ගැනීමට අපහසු වන බැවින් විනය පිළිබඳව ගැටළුකාරී තත්වයක් මතුව ඇත. එබැවින් එම නිලධරයන් තනතුරේ ස්ථිර වනතුරු වැඩ බලන කාලය තුළදී හරස් බඳ පටිය නොපලඳින ලෙසට උපදෙස් ලබා දෙන ලෙසද.

03. පසුගිය මැතිවරණ රාජකාරී වලදී උප පොලිස් පරීක්ෂක නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන රාජකාරී සඳහා යොදවා නොමැති අතර, මෙවර පැවති මහමැතිවරණ විශේෂ රාජකාරියේදී අවි සහිතව ඡන්ද මධ්‍යස්ථාන වල රාජකාරි යොදවා තිබූ බවට සාමාජිකත්වය විසින් අප සංගමය දැනුවත් කර ඇත. එම රාජකාරිය කණිෂ්ඨ නිලධරයන් විසින් සිදුකරනු ලබන රාජකාරියක් බැවින්, ඒ සම්බන්ධයෙන් ඉදිරි මැතිවරණ වලදී පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි යෙදවීමෙන් මුදවා හරින ලෙසද.

ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර, එම ගැටළු විසඳා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.